# කිරිබත් පෙරේති



ජෙනුකි සෙයන්සා වීරවර්ණ

# කිරිබත් පෙරේති

## ජෙනුකි සෙයන්සා වීරවර්ණ

කතෘගේ වෙනත් කෘතීන් ;

ආඩම්බර රෝස මල

පුංචි සමනලී

මහ/ මහාමායා බාලිකා විදුහල

5 ශ්‍රේණිය A

2025.02.08

ISBN : 978-624-208-719-1

# පිදුම

මා ඇති දැඩි කල මාගේ ආදර අම්මාට ,
තාත්තාට සහ ආදර මල්ලීට.....

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡෙද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලිය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.
ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණි"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.
මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දිමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

එකෝමත් එක ගමක ගමරාල කෙනෙකුයි ගමහාමිනේ කෙනෙකුයි හිටියා. ඒ දෙන්නා හරිම සතුටින් ජීවත් වුණා.



ගමරාළයි ගමහාමිනෙයි කිරිබත් කන්න හරිම ආසයි. ඉතින් ඔන්න දවසක් ගමහාමිනේ කිරිබත් හැදුවා. කිරිබත් කතාවට දෙන්නා රන්ඩු උනා.



දවසක් ගමරාළ ගෙදරට අවශ්‍ය බඩු ගෙන ඒමට කඩයට ගියා.



ඒ අතරතුර අණ බෙරකාරයා පණිවිඩයක් කීවා.

"අසව් ! අසව් ! රජතුමාගේ බිසවගේ නහයේ ලොකු ඇටයක් හිරවෙලා, ඒක අයින් කරන්න පුලුවන් නම් රජතුමාගෙන් ලොකු තෑග්ගක් !!!"



ඉතින් ඒ පණිවිඩය ගමහාමිනේටත් ඇසුණා.

" මම ගමරාළට පුලුවන් කීවොත් මට කිරිබත් කන්න පුලුවන්" ගමහාමිනේ හිතුවා.



ඉතින් ගමහාමිනේ අණ බෙරකාරයාට මෙහෙම කීවා.

" අපේ ගමරාළට පුලුවන් ඔය වැඩේ කරන්න "

ඉතින් එතකොටම ගමරාළ ආවා. එය ඇසුණු අණබෙරකරු ගමරාළව කැටුව ගියා.



" අවසරයි දේවියන් වහන්ස, ගමරාළ බිසවුන් වහන්සේගේ නහයේ හිරවුණු ඇටය අයින් කරන්න පුළුවන් බව පැවසුවා. "

අණබෙරකරු රජතුමාට පැවසුවා. රජතුමා එයට කැමති වුණා.




ඉතින් රජතුමා බිසව සිටින තැන පෙන්නුවා.

කිරිබත් පෙරේති කියලා ගමරාළ කිව්වා. ඒකට බිසවට හොඳටම හිනා. ඉතින් එතකොටම බිසවගේ නහයේ හිරවු ඇටය වැටුණා. ගමරාළටයි බිසවටයි හරිම පුදුමයි.



රජතුමාට හරි සතුටුයි. රජතුමා ගමරාළට පාට පාට මැණික් සහ රන් කාසි පිරිච්ච පෙට්ටියක් ගමරාළට දුන්නා.



පෙට්ටියත් අරගෙන ගමරාළ ගෙදර ගියා. එතකොට ගමහාමිනේ කිරිබත් කකා හිටියේ. ගමරාළව දැක්පු ගමහාමිනේ බය වුණා. තමා කරපු වැරද්ද ගමහාමිනේට වැටහුණා.





## පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශිය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.
මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.
මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිපිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිපිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්